(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 109.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 ජූලි මස 21 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0479/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය භාරය කවරේද;

(ii) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබ ඇති, අභ්‍යන්තරික තැනැත්තන් විසින් සිදු කරන ලද වංචනික ගනුදෙනු සංඛ්‍යාව කොපමණද;

(iii) එම විමර්ශන කටයුතුවලට සම්බන්ධ නම් සහ සිද්ධි කවරේද;

(iv) මේ වන විට එම විමර්ශන කටයුතුවලින් ලැබී ඇති ප්‍රතිඵලය කවරේද;

(v) එම සිද්ධි සමථයකට පත් කොට හෝ ඒ වෙනුවෙන් දඩ මුදල් අය කරනු ලැබ තිබේද;

(vi) අය කරනු ලැබූ දඩ මුදල් ප්‍රමාණයන් සහ එක් එක් පැමිණිල්ල සමථයකට පත් කරනු ලැබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0922/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ හයක කාලය තුළ බාල වර්ගයේ ඖෂධ ගෙන එන ලද සමාගම් ලෙස හඳුනාගෙන ඇති සමාගම් සංඛ්‍යාව කවරේද;

(ii) එම සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් සමාගම විසින් බාල වර්ගයේ ඖෂධ ගෙන ඒම නිසා රජයට සිදුවූ පාඩුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් සමාගම් විසින් රජයට ආපසු ගෙවා ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බාල වර්ගයේ ඖෂධ ගෙන ආ බවට හඳුනාගෙන ඇති එක් එක් සමාගමේ සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම සමාගම් අතුරින් මේ වන විට අපලේඛනගත කර (Black list), තහනම් කර ඇති සමාගම් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ සමාගම්වල නම් කවරේද;

(iv) ඉහත පරිදි තහනම් කර ඇති සමාගම්වලින් වර්ෂ 2006 සිට 2010 දක්වා කාල සීමාවේදී නැවත ඖෂධ මිලදී ගැනීම් සිදුකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1047/'10

3.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) දිවයිනේ විවිධ පළාත්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීම සම්බන්ධයෙන් 2006.10.25 දින අමාත්‍ය මණ්ඩලය එළැඹි තීන්දුවකට අනුව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47උප හා 2007.02.10 දිනැති උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අයදුම්පත් කැඳවන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව මධ්‍යම පළාත තුළ ගුරු සහායක තනතුර සඳහා අයදුම්කළ සංඛ්‍යාව කොපමණද;

(ii) සම්මුඛ පරීක්ෂණයෙන් එම තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන් අතරින් මේ වන විටත් ඉහත පත්වීම් ලද පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවලට අයත් අධ්‍යාපන කලාප මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1223/'11

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1417/’11

5.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, සවලකඩේ සිට නාවිදන්වෙලි හරහා අන්නමලේ දක්වා වූ ප්‍රධාන මාර්ගය අලුත්වැඩියා කර දෙන ලෙස එම ප්‍රදේශයේ සමාජ සංවිධාන විසින් රජයෙන් ඉල්ලා ඇති බවත්;

(ii) මෙම මාර්ගයේ කල්මුනේ සිට මණ්ඩූර් දක්වා වූ බස් සේවාවක් ක්‍රියාත්මක වන අතර මෙය පඩුවන්කරේ ප්‍රදේශය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගවලින් එකක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව, අන්නමලේ මහා විද්‍යාලය, ශ්‍රී ශක්ති විද්‍යාලය, ශ්‍රී ෂන්මුග විද්‍යාලය යනාදියට ප්‍රවේශ විය හැකි එම මාර්ගයේ වැදගත්කම සලකා වහාම එය පිළිසකර කරදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0851/’10

6.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 සහ 2010 වර්ෂවල දේශීය සහල් පරිභෝජනය කොපමණද;

(ii) 2011 සහ 2012 වර්ෂවල පරිභෝජනය සඳහා අවශ්‍යවේ යැයි ගණන් බලා ඇති සහල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 පෙබරවාරි මස සහල් මෙට්‍රික් ටොන් 100,000 ආනයනය කළ රජයේ ආයතනයන්හි නම් කවරේද;

(ii) ඉහත ආනයනයන් සඳහා මුදල් ලැබුනු මූලාශ්‍ර කවරේද;

(iii) මෙසේ ආනයනය කරන ලද සහල්වල ආනයනික මිල, විකුණුම් මිල, අලෙවි කරන ලද ප්‍රමාණය සහ ගබඩා කර තිබෙන ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආනයනය කරන ලද සහල් කිලෝග්‍රෑමයක මිල රු. 65/= ට වඩා වැඩියෙන් තිබියදී, මෙසේ ආනයනය කරන ලද සහල් මෙට්‍රික් ටොන් 30,000ක් පමණ එක් කිලෝග්‍රෑමයක් රු. 31/= බැගින් 2010 සැප්තැම්බර් මාසයේදී පෞද්ගලික අංශයට අලෙවි කර ඇති බවත්,

(ii) මෙම සහල් දේශීය වෙළෙඳපොළෙහි අලෙවි නොකරන ලෙසට රජය අවධාරණය කර තිබුණද, පෞද්ගලික වෙළෙඳුන් ඒවා දේශීය වෙළෙඳපොළෙහි අලෙවි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) මෙසේ සහල් අලෙවි කළ පෞද්ගලික වෙළෙඳුන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1001/'10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ රජයේ රෝහල්වල සේවය කරන හෙද නිලධාරීන් සහ ඊට පහළ තනතුරුවල ස්ථිර සේවයේ නියුතු සේවක සංඛ්‍යාව;

(ii) ඔවුන් වෙනුවෙන් මාසිකව වැටුප් ලෙස ගෙවනු ලබන මුදල;

(iii) අතිකාල දීමනා ලෙස ගෙවනු ලබන මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) වර්ෂ 2010 නොවැම්බර් මාසයේ වැටුප සමඟ ඔක්තෝබර් මාසය වෙනුවෙන් ඔවුන්ට ගෙවනු ලබන අතිකාල දීමනා නොගෙවූ බවත්;

(ii) එවැනි තත්ත්වයක් යටතේ සේවකයින්ට තම වේතනය මාසිකව කළමනාකරණය කර ගැනීමේ දී ගැටලු ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එලෙස අතිකාල දීමනා ගෙවීම ප්‍රමාද වීමට හේතු වූ කරුණු කවරේද;

(ii) එම තත්ත්වය විසඳීම සඳහා කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1048/'10

8.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල, විල්ගමුව, ගලේවෙල හා මාතලේ යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 31 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1224/'11

9.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජාතික උරුමයන් අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1449/'11

10.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) මෙරට තිබෙන තැපැල් කාර්යාල විශාල ප්‍රමාණයක දමිළ නිලධාරීන් හෝ දමිළ භාෂාව පිළිබඳ නිපුණතාවයක් ඇති නිලධාරීන්ගේ හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) සියලුම තැපැල් කාර්යාලවල පවතින එවැනි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි එම සියලුම පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0852/'10

11.

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව 2018 වර්ෂයේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවය සඳහා සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමට උත්සාහ කරන්නේද;

(ii) එසේ නම්, එම කාර්යය සඳහා සකස්කර ඇති සැලැස්ම කවරේද;

(iii) එම ක්‍රීඩා උත්සවය සඳහා සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමට අයදුම් කිරීමේදී අනුමතිය ලැබීම සඳහා වන මූලික වියදම කොපමණද;

(iv) මෙම කාර්යය සඳහා මූලික වී කටයුතු කරන පුද්ගලයාගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩා උත්සවය සඳහා සත්කාරක රට ලෙස ක්‍රියාකිරීමේ අවස්ථාව ශ්‍රී ලංකාවට පිරිනමනු ලැබුවහොත්, එම උත්සවය පැවැත්වීමට අපේක්ෂා කරන දිස්ත්‍රික්කයේ සහ නගරයේ නම් කවරේද;

(ii) ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා දැරිය යුතු ආයෝජන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) (i) සත්කාරක රට තෝරාගැනීමට නාමයෝජනා කැඳවූ විට ශ්‍රී ලංකාවේ නම යෝජනා කරන සහ ස්ථිර කරන රටවල නම් කවරේද;

(ii) ශ්‍රී ලංකාව හැරුණු විට 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවයේ සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමට තරඟ කරන අනෙකුත් රටවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1002/'10

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් විසඳුම් ලබා දී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) විසඳුම් ලබා දීමට ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මානව හිමිකම් කඩ කිරීම සම්බන්ධයෙන් පැමිණිලි ලැබී ඇති ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනය සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අනුව වැඩිම චෝදනා සංඛ්‍යාවක් එල්ල වී ඇති ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1049/'10

13.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, නුවරඑළිය, හඟුරන්කෙත, කොත්මලේ හා හැටන් යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 50 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1225/'11

14.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණ ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1450/'11

15.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම, මුත්තමිල් නාගරික ප්‍රදේශයේ, මන්නාරම අධ්‍යාපන කලාපයේ සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබන කාන්තාවන් සඳහා වූ අවිධිමත් අධ්‍යාපන වැඩසටහන් යටතේ ආරම්භ කර ඇති ගොවිපළ කටයුතු පුහුණු කිරීමේ පාඨමාලාව පැවැත්වීම සඳහා ප්‍රදේශයේ පොදු අවශ්‍යතා සඳහා ඉදිකර දී ඇති ගොඩනැගිල්ල ලබා නොදී එය එක් පුද්ගලයෙකුගේ පාලනය යටතේ තබා ඇති බවත්;

(ii) එබැවින් එම ප්‍රදේශයේ කාන්තාවන් එම ගොඩනැගිල්ලේ පිටත බිම වාඩි වී හෝ එකී පාඨමාලාව හැදෑරීමේ අනිවාර්ය තත්ත්වයට පත් වී ඇති බවත්;

(iii) කාන්තාවන් සඳහා වූ අවිධිමත් අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට එල්ල වී ඇති ඉහත බාධාකාරී තත්ත්වය මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවධානයට ද ලක්කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පාඨමාලාව පැවැත්වීමට හැකිවන පරිදි පොදු අවශ්‍යතා සඳහා ඉදිකර ඇති ඉහත සඳහන් ගොඩනැගිල්ල වහාම විවෘත කර දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**ශෝක ප්‍රකාශ යෝජනා**

1.

අභාවප්‍රාප්ත ගරු ටිරෝන් ප්‍රනාන්දු මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

2.

අභාවප්‍රාප්ත ගරු ඇල්බට් ද සිල්වා මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

3.

අභාවප්‍රාප්ත ගරු ඊ. එල්. බී. හුරුල්ලේ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2011.07.22 වැනි දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.30 සිට අ. භා. 7.00 දක්වා විය යුතුය. අ. භා. 4.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ නියමය,— 1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වැනි වගන්තිය යටතේ සාදන ලදුව, 1964 ඔක්තෝබර් 1 වැනි දින අංක 14186 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ (V) වැනි කොටස සංශෝධනය කරමින්, එම පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ජුනි 30 දිනැති අංක 1712/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.07.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*3.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*4.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*12.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*13.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

16.

අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

ඔලංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

21.

රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**